# ධම්මපදය

## පුප්ඵ වර්ගය (04 ගාථාව)

**4. ගාථාව**

**"පුප්ඵානි හෙව පචිනන්තං - බ්‍යාසත්තමනසං නරං**
**සුත්තං ගාමං මහෝඝෝව - මච්චු ආදාය ගච්ඡති."**

**පදාර්ථය**

| | | |
|---|---|---|
| **පුප්ඵානි හෙව පචිනන්තං** | - | මල් නෙළා රැස් කරන්නෙකු මෙන් |
| **බ්‍යාසත්තමනසං** | - | තදින් ඇලුණු සිත් ඇති (පස්කම් සැපයෙහි තදින් ඇලුණු) |
| **නරං** | - | සත්ත්වයා |
| **මහෝඝෝ** | - | මහදිය පහරක් |
| **සුත්තං** | - | නිදිගත් |
| **ගාමං ඉව** | - | ගමක් (වැසියන් ද සමග මුහුදට) ගසාගෙන යන්නාක් මෙන් |
| **මච්චු** | - | මෘත්‍යු මාර තෙමේ |
| **ආදාය** | - | ගෙන යයි |

**භාවාර්ථය**

'මෙයට වඩා අසවල් තැන මල් හොඳ යැ'යි සිතමින් මල් රැස් කිරීමෙහි පමා වන පුරුෂයා මෙන් සසර ප්‍රමාදවන පුද්ගලයාව මහවතුරක් නිදිගත් මිනිසුන් ඇති ගමක් යට කොට යන්නාක් මෙන් මරුවා විසින් ඇද ගෙන යනු ලැබේ. (එනම්, අපාය නමැති මුහුදට පමුණුවන්නේ ය.)

**නිදාන කථාව**

දිනක් කොසොල් රජතුමාට මෙසේ අදහස් විය. 'බුදුරජාණන් වහන්සේගේ ඥාති කුලයකින් කුමාරිකාවක් ගෙන්වා අග මෙහෙසුන් කළේ නම් බුදුරජාණන් වහන්සේ මට නෑ වන සේක. එකල භික්ෂූහු ද නිරතුරු ව මාළිගාවට වඩින්නාහ'යි සිතා, "මට දූ කුමාරිකාවක් එවන්නැ"යි කියා ශාක්‍යයන් වෙත පණිවුඩ යැවී ය.

ශාක්‍යයෝ ද ජාතිමදයෙන් මත් ව සිටි හෙයින් තමන්ගේ කුලයට නො ගැළපෙන රජ කෙනෙකුට සිය කුමරියක පාවා දීමෙන් අත්වන අවමානය ගැන සලකා මහානාම ශාක්‍ය රජහට දාව දාසියකගේ කුසින් උපන් වාසභ-ඛත්තියා නම් තරුණිය පාවා දී කොසොල් රජු රැවටූහ.

ඕ තොමෝ නොබෝ කලකින් පුතෙකු වැදුවා ය. රජ තෙමේ ඔහුට 'විඩූඩභ' ය යි නම් කළේ ය. විඩූඩභ කුමර තෙමේ සොළොස් හැවිරිදි කල්හි මුතුන්මිත්තන් දකිනු කැමති ව මහපෙරහරින් කිඹුල්වත් පුරයට ගියේ ය. ඔහු එහි කිහිප දවසක් නැවතී සිට පෙරළා සිය රට බලා ආවේ ය. කිඹුල්වත් පුර දාසියක්, එහි දී ඔහු හුන් පුටුව බැහැරට ගෙන "මේ වාසභත්තියාවගේ (දාසියගේ) පුතා හුන් පුටුව ය"යි දෙස් කියමින් කිරිදියෙන් සෝදන්නට වූවා ය. ඒ අතර විඩූඩභගේ සේවකයෙක් ආයුධයක් අමතක කොට ගියේ, එය ගෙන යන්නට නැවත හැරී ආවේ ය. දාසිය විසින් කුමාරයාට දෙස් කියන හඬ ඇසූ ඔහු තොරතුරු දැන ගෙන සිය පිරිසට එපවත් දැන්වී ය එවිට වාසභඛත්තියා රජකුමරියක් නොව දාසිදුවකැ'යි එහි මහත් කෝලාහලයක් විය. විඩූඩභ තෙමේ මෙය දැන, "මොවුහු මා හුන් පුටුව කිරිදියෙන් සේදූහ. මට රජකම ලැබුණු විට ඔවුන්ගේ ලේවලින් මාගේ පුටුව යළිත් සෝදවන්නෙමි" යි සිතා වෛර බැඳ ගත්තේ ය.

ඇමතියෝ ඔහු සැවැත් නුවරට පැමිණි කල්හි ඒ පුවත කොසොල් රජුට දැන්වූහ. රජ ඒ පුවත අසා කිපී, වාසභඛත්තියාවටත් හා පුතුට දුන් සම්පත් නවත්වා දාසිදස්සන් විසින් ලැබිය යුත්තක් පමණක් ම දුන්නේ ය. කිහිප දවසකට පසු බුදුරජාණන් වහන්සේ රජගෙට වැඩි සේක. රජතුමා බුදුරජාණන් වහන්සේට මේ කරුණ සැලකිරීමෙන් පසු පිය-පක්ෂය පමණක් සැලකීම මේ සඳහා සෑහෙන බව වදරා බුදුරජාණන් වහන්සේ 'කට්ඨහාරි' ජාතකයෙන් ධර්මදේශනා කළ සේක. රජ තෙමේ දහම් අසා සතුටු ව මවටත් පුතාටත් ඒ ඒ සම්පත්-තනතුරු නැවතත් දෙවී ය.

පසු ව කොසොල් රජුගෙන් රජකම උදුරාගත් විඩූඩභ තෙමේ නොබෝ දවසකින් ශාක්‍යයන්ගෙන් පලිගැනීම සඳහා යුද සෙනග පිරිවරා කිඹුල්වත් නුවරට යාමට පිටත් විය.

එදවස බුදුරජාණන් වහන්සේ ලොව බලා වදරණ සේක්, නෑයන්ට වන විනාශය දැක විඩූඩභ රජ යුද පිණිස යන මග ශාක්‍ය ජනපදයට අයත් තුනී සෙවනැති ගසක් මුල වැඩහුන් සේක. ඒ නුදුරෙහි කොසොල් රට සීමාවෙහි මහත් සෙවනැති ගසක් ද විය.

විඩූඩභ තෙමේ බුදුරජාණන් වහන්සේ දැක ළඟට ගොස් වැඳ "ස්වාමීනි, මේ ග්‍රීෂ්ම වේලෙහි තුනී සෙවනැති ගසක් මුල වැඩහුන්නේ කිම ද? අර මහාසෙවනැති නුග ගස මුල වැඩහුන මැනව"යි කියා කීය. එවිට බුදුරජාණන් වහන්සේ, "නෑ-සෙවන සිසිල් වෙයි" යනුවෙන් වදළ කල්හි නෑයන්ට වැඩ පිණිස බුදුරජුන් වැඩි බැව් දැන පෙරළා සැවැත් නුවරට ගියේ ය. මෙසේ දෙවැනි වර, තෙවැනි වර දක්වා බුදුරජාණන් වහන්සේ නිසා යුද ගමන වැළකිනි. ශාක්‍යයන්ට නො වැළැක්විය හැකි කර්ම-විපාක වාරයක් එළඹ ඇති බව දැන ගත් බුදුරජාණන් වහන්සේ සිවුවැනි වර එහි නො වැඩියෙන් විඩූඩභ රජ තෙමේ කිඹුල්වත් නුවරට වැදී ශාක්‍යයන් වනසන්නට පටන් ගත්තේ ය.

විඩූඩභ රජ තෙමේ බොහෝ ශාක්‍යයන් මරවා පෙරළා සැවැත් නුවරට යන්නේ රාත්‍රියෙහි වියළී තිබුණු අචිරවතී ගඟ අසබඩ කඳවුරු බැඳ නිදගත් කල්හි මහරෑ මහාගංවතුරක් ගලා අවුත් පිරිස් සහිත විඩූඩභ මුහුදට ගසාගෙන ගොස් මරණයට පත් විය.

පසු දිනක මෙය අරභයා දම්සභා මණ්ඩපයෙහි දී භික්ෂූන් වහන්සේලා අතර කතාවක් උපනි. ඒ වේලෙහි එහි වැඩම කළ බුදුරජාණන් වහන්සේ, වැඩම කිරීමට පෙර භික්ෂූන් වහන්සේලා අතර උපන්නා වූ කථාව දැන,

"මහණෙනි, මේ සත්ත්වයන් තම මනදෙළ මුදුන් පමුණුවා ගන්නට මත්තෙන් ම මාර තෙමේ නිදිගත් ගමක ගම්වැසියන් යටපත් කොට ගෙන යන මහත් සැඩපහරක් මෙන් ජීවිතේන්ද්‍රිය සිඳ දමා සතර අපාය නමැති මහමුහුදෙහි ගල්වාය" යි වදරා "**පුප්ඵානි හෙව පචිනන්තං**" යන ගාථාව වදරා දහම් දෙසූ සේක.

ධර්මදේශනාව අවසානයෙහි බොහෝදෙනා සෝවාන්-පලාදියට පැමිණියෝ ය. දේශනාව මහජනයාට වැඩ සහිත විය.

**සාධු ! සාධු !! සාධු !!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(මැදින් 2551)**

__සම්පාදක:__ පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

__පරිගණක සැකසුම:__ පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

__ධර්මදානය:__ පින්වත් දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් දෙමවුපියන්ට ආශිර්වාද පිණිසත් තමාට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්‍දයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**